මානසික සංකූලතාවයක්, මානසික සමතුලිතතාවය බිඳ වැටීමක් හෝ මානසික ආබාධයක් හැඳින්වීමට "පිස්සු" යන යෙදුම පොදුවේ යොදාගැනීම තවමත් ජන සමාජය තුළ දක්නට ලැබේ. මෙම "පිස්සු" හෝ "පිස්සා" වැනි යෙදුම් තුළ සමාජ ගර්හාවක්ද අන්තර්ගත වන නිසා, මේ ඔස්සේ මානසික ආබාධයක් සහිත අයෙකු විසින් ඊට ප්‍රතිකාර රැගෙන යළි සමාජයට එකතු වීමට උත්සාහ ගැනෙනු වෙනුවට, ඔවුන්ව වඩ වඩාත් සමාජයෙන් කොන් වීම සිදුවේ. ඊට අමතරව, වර්තමානයේදී සංකීර්ණ විෂය මාලාවක් ලෙසින් ඉගැන්වෙන මානසික ආබාධ තත්වයන්, හුදු "පිස්සුවකට" ලඝු කිරීම ඔස්සේ, මානසික ආබාධ සම්බන්ධ නිවැරදි දැනුවත්භාවයක් සමාජයට ලැබේද යන්න ද පැනයකි.
මීට උදාහරණ ලෙස, මව්බිම පුවත්පතේ එකම දිනයක පළවූ සිරස්තල දෙකක් දැක්විය හැක.

"බොරැල්ල පල්ලියේ බෝම්බෙ තිබ්බේ පිස්සෙක්ද?" - මව්බිම - ජනවාරි 23, 2022

"ළමා නිරුවත විකුණන ෆේස්බුක් පිස්සෙක්ට උඩ ගෙඩි දුන්නු ළමාරක්ෂකයේ හැටි...!" - මව්බිම - ජනවාරි 23, 2022

පුවතකට සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමට ඇති අයිතියත්, අඩු වචන ප්‍රමාණයකින් අර්ථයක් ලබාදීමට ඇති අවශ්‍යතාවයත් අවබෝධ කරගත හැක.

එසේ වුවත්,

1) "පිස්සා" වැනි සමාජ ගර්හාවක් ද සමගින් පැමිණෙන යෙදුම්, මානසික ආබාධ හෝ සංකූලතා සහිත අයවලුන් හැඳින්වීමට උචිත වේ යැයි ඔබ සිතන්නේ ද?

2) "මානසික ආබාධයක් සහිත අයෙකු" හෝ වෙනත් එවැනි යෙදුමක් ඒ වෙනුවට භාවිතා කිරීම වඩාත් උචිත නොවන්නේ ද?
ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?